ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,512 - 2026 ඔක්තෝබර් මස 23 සිකුරාදා - 2026.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව		පිටුව
තනතුරු ඇබෑර්තු	-	විභාග, විභාග ප්‍රතිඵල ආදිය	-

සැ.යු.: (i) ද ගුඩ්නස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2026.10.16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2026.10.16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

සතිපතා නිකුත් වන *ගැසට් පත්‍රයෙහි* පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම් සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 නොවැම්බර් මස 13 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ඔක්තෝබර් මස 30 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ප්‍රසන්න ජයරත්න,
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

0000 - B 82841 - (2026/10)
E - 01

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබුවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම කැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්ව්ලෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යටෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම්, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යටෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම් ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්ට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අනිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියක් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

1976 අංක 19ත් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සක් කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලිසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පොදුජනයා දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වූවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බස කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය භාරගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය භාරගනුත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. භාරගනුත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිබිතව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සම්පයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සම්පයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම හෝ වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. :

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහනික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බිලූටූත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පැන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රුලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳින රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවහ් සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කරා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

තනතුරු - ඇබෑර්තු

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

කම්කරු විනිශ්චය සභා සහකාර ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම - 2026

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ කම්කරු විනිශ්චයාධිකාරයන් හි පුරප්පාඩුව පවතින සහකාර ලේකම් තනතුරු 13 ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම් සපුරාලන ඒකාබද්ධ සේවයට අයත් කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙහි පල කර ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර **ලේකම්, කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලය, අංක 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස ඉහළ කෙලවරේ **"කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ කම්කරු විනිශ්චය සභා සහකාර ලේකම් තනතුර සඳහා බඳවා ගැනීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026.11.23 දින වේ.

අයදුම්පත් යොමු කළ හැක්කේ ඒකාබද්ධ සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ නිලධාරින්ට පමණි.

සටහන - ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතු ය.

01. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් විසින් අයදුම්පත් කැඳවා, එම අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා බඳවා ගැනීම් සිදු කරනු ලබයි.

02. **තනතුරේ ස්වභාවය -**
මෙම තනතුර ස්ථීර, විශ්‍රාම වැටුප් සහිත වේ.

03. **වැටුප් පරිමාණය -**
MN 2 – 2025 - රු.48,470-10X540-11X630-10X1,010-10X1,190 – රු. 82,800/-

04. **මූලික සුදුසුකම් -**

ඒකාබද්ධ සේවයට අයත් කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

05. **තෝරා ගනු ලබන ක්‍රමය -**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු මත කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු වලට බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීමේ පරිපාටිය, පුරප්පාඩු පවතින කම්කරු විනිශ්චයාධිකාරයන්ගේ තොරතුරු හා ආදර්ශ අයදුම්පත්‍රය අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ (www.moj.gov.lk) පළ කර ඇත.

06. ඉල්ලුම් පත්‍රයට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුලත් කළ යුතු ය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍ර මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රට අනුව සැකසිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

සියලුම අයදුම්පත් තමන් දැනට සේවයේ නියුතු ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතු වේ.

07. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

08. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍යය නිවේදනය අනුව කටයුතු කළ යුතු ය.

ජනාධිපති නීතිඥ අයෙෂා ජීනසේන,
ලේකම්.
අධිකරණ සහ ජාතික
ඒකාබද්ධතා අමාත්‍යාංශය.

2026 ඔක්තෝබර් මස 07 වැනි දින,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

අංකය ..... (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)		
භාෂා මාධ්‍යය	**සිංහල**	
	දෙමළ	

ආදර්ශ අයදුම්පත්‍රය
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

කම්කරු විනිශ්චය සහා සහකාර ලේකම් තනතුර සඳහා වන අයදුම් පත්‍රය

01. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) - .....
.....

මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - .....
.....

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) - .....
.....

සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - .....
.....

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) - .....
.....

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - .....
.....

04. ලිපි එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - .....
(ස්ථිර ලිපිනයෙන් වෙනස් වේ නම් පමණක් සම්පූර්ණ කරන්න).....

05. දුරකථන අංකය - පෞද්ගලික: ..... කාර්යාලය: .....
(වට්ස් ඇප්)

06. විද්‍යුත් තැපැල් ලිපිනය - .....

07. ජාතික හැඳුනුම්පත් අංකය -

08. ස්ත්‍රී/පුරුෂ භාවය -

ස්ත්‍රී	
පුරුෂ	
වෙනත්	

09. උපන් දිනය - වර්ෂය ..... මාස ..... දින .....

10. පුරවැසිභාවය - .....

11. විවාහක/අවිවාහක බව - .....

12. වර්තමාන සේවා ස්ථානය සහ තනතුර -
.....
.....

13. කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණියට පත් වූ දිනය - .....

14. වෙනත් සුදුසුකම් (ලකුණු දීමේ පටිපාටියෙහි දක්වා ඇති තොරතුරු අනුව සඳහන් කරන්න) - .....
.....
.....
.....
.....

15. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
[අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න] ඔව් ☐ නැත ☐

(ඔව් නම් විස්තර සඳහන් කරන්න) .....
.....

16. ඔබ සම්බන්ධව යම් නොවිසඳුනු විනය ක්‍රියාමාර්ගයක් පවතී ද?
[අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න] ඔව් ☐ නැත ☐

(ඔව් නම් විස්තර සඳහන් කරන්න) .....
.....

17. ඔබ සුදුසුකම් මත තෝරා ගතහොත් අනුයුක්ත වීමට මනාපය පල කරන කම්කරු විනිශ්චයාධිකාර 03 ක් අනුපිළිවෙලින් සඳහන් කරන්න.

1. .....
2. .....
3. .....

(කම්කරු විනිශ්චයාධිකාර ලැයිස්තුව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පල කර ඇති අතර, ඔබ විසින් මනාපය පල කරන ආයතනයක් සඳහාම අනුයුක්ත කරන බවට සහතිකයක් ලෙස මෙය නොසැළකිය යුතු ය.)

18. **අයදුම්කරුගේ සහතිකය :**

I. මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශකර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

II. මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍යය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

III. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

....., ...,
දිනය අයදුම්කරුගේ අත්සන.

19. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ...../...../..... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව සහතික කරමි.

....., ...,
දිනය අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : .....
තනතුර : .....
ලිපිනය : .....
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

20. **ආයතන ප්‍රධානියාගේ සහතිකය :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මයා/මිය/මෙනවිය ...../...../..... දින සිට ..... ආයතනයේ ස්ථීර/තාවකාලික/අනියම් නිලධාරියකු/ නිලධාරිනියක වශයෙන් සේවය කරන බවත්, ඔහු / ඇය විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, නිලධාරියා සම්බන්ධව නොවිසඳුනු විනය කටයුත්තක් ඇති / නැති බවත්, යම් විනය කටයුත්තක් ආරම්භ කිරීමට නියමිත / නියමිත නැති බවත්, අයදුම්පත් කැඳවීමේ නිවේදනය ප්‍රකාරව ඔහු / ඇය මේ සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, එම නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු / ඇය සේවයෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත් දන්වමි.

.....,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය - .....
නම - .....
තනතුර - .....
අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව - .....

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීමේ ක්‍රමය

01. කාර්මික ආරාවුල් පනත පිළිබඳ දැනුම - ලකුණු 10

02. ලංකාවේ අධිකරණ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම - ලකුණු 10

03. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් : - ලකුණු 40

I. සහතික පත්‍ර පාඨමාලා - ලකුණු 10

- රජයේ පිළිගත් ආයතනයක් විසින් පිරිනමන ලද සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (එක් සහතික පත්‍රයකට ලකුණු 02 බැගින් උපරිම සහතික පත්‍ර 05ක් සඳහා)

II. පුහුණුවීම් - ලකුණු 10

- සමස්ථ සේවා කාලය තුළ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, මානව සම්පත් කළමනාකරණය, මහජන සම්බන්ධතා, වැටුප්, විනය, පෞද්ගලික ලිපිගොනු ආදිය හා රාජකාරී විෂයය ක්ෂේත්‍ර ආවරණ වන පරිදි ලබාගෙන ඇති පුහුණුවීම් සඳහා (එක් සහතික පත්‍රයකට ලකුණු 02 බැගින් උපරිම සහතික පත්‍ර 05ක් සඳහා)

III. ඉංග්‍රීසි දැනුම - ලකුණු 10

- ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - මාස 06-12 දක්වා (ලකුණු 10)
- සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා - මාස 03-06 දක්වා (ලකුණු 05)
  - වෙනත් (ලකුණු 03)

(ඉහළම සුදුසුකම සඳහා ලකුණු ලබා දීම සිදු වේ.)

IV. පරිගණක දැනුම - ලකුණු 10

- ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - මාස 06-12 දක්වා (ලකුණු 10)
- සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා - මාස 03-06 දක්වා (ලකුණු 05)
  - වෙනත් (ලකුණු 03)

(ඉහළම සුදුසුකම සඳහා ලකුණු ලබා දීම සිදු වේ.)

04. ජ්‍යෙෂ්ඨත්වය : - ලකුණු 10

කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ සේවා කාලය සඳහා

- වසරකට ලකුණු 01 බැගින් උපරිම වසර 10ක් සඳහා
- වසරකට අඩු හා මාස 06කට වැඩි කාලසීමාවක් සඳහා ලකුණු 0.5
- මාස 06කට අඩු හා මාස 03කට වැඩි කාලසීමාවක් සඳහා ලකුණු 0.25

සටහන :
- මාස 03ට අඩු කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

05. සේවා පළපුරුද්ද : - ලකුණු 15

- කම්කරු විනිශ්චය සහා ලේකම් කාර්යාලයේ හෝ කම්කරු විනිශ්චය සභාවක කළමනාකරණ සේවා නිලධාරි ලෙස සේවය කර තිබීම (වසරකට ලකුණු 01 බැගින් උපරිම වසර 10ක් සඳහා) - ලකුණු 10
- ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි ලෙස සේවය කිරීම - ලකුණු 05 (වසරකට ලකුණු 01 බැගින් උපරිම වසර 05ක් සඳහා)

සටහන :

- සේවා පළපුරුද්ද සඳහා මාස 06කට නොඅඩු හා වසරකට අඩු කාලසීමාවක් සඳහා වසරකට හිමිවන ලකුණු ප්‍රමාණයෙන් අඩක් හිමි වේ. කෙසේ වුව ද මාස 03කට අඩු සේවා කාලයන් සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

- සේවා පළපුරුද්ද සම්බන්ධයෙන් ඉදිරිපත් කරන තොරතුරු අදාළ ආයතන වෙතින් නිකුත් කළ ලේඛන මගින් තහවුරු කළ යුතු ය.

06. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා : ලකුණු 15

- සන්නිවේදන හැකියාව (ලකුණු 05)
- නායකත්වය (ලකුණු 05)
- පෞරුෂත්වය (ලකුණු 05)

එකතුව **ලකුණු 100**

සහකාර ලේකම් තනතුර පුරප්පාඩුව පවතින කම්කරු විනිශ්චයාධිකාරයන්

කම්කරු විනිශ්චය සභා අංකය	*ලිපිනය*
09	අධිකරණ සංකීර්ණය, නුවරඑළිය
10	26/4, සාන්තු නිවාස පාර, හැටන්
19	මහාධිකරණ භූමිය, අවිස්සාවේල්ල
26	අධිකරණ සංකීර්ණය, ලැබීම, කඹුරුගමුව
28	අධිකරණ සංකීර්ණය, හලාවත

කම්කරු විනිශ්චය සභා අංකය	*ලිපිනය*
33	නව අධිකරණ සංකීර්ණය, හෝමාගම
34	පැරණි මොරවක මහෙස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල, ගල්දොළ, කොටපොල
36	වැලිමඩ පාර, බණ්ඩාරවෙල
38	නව අධිකරණ සංකීර්ණය, බෙලි පාර, නාවලපිටිය
39	පලාපත්වල, මාතලේ
44	උසාවි සංකීර්ණය, අම්පාර
ත්‍රිකුණාමලය	උසාවි සංකීර්ණය, ත්‍රිකුණාමලය
යාපනය	03 වන මහල, මහාධිකරණ සංකීර්ණය, යාපනය

**නව බඳවාගැනීම් වලදී අභ්‍යන්තර ස්ථාන මාරු ලබා දීම සම්බන්ධව ද සලකා බලන බැවින් ඉහත පුරප්පාඩු පවතින ස්ථාන, සුළු වශයෙන් වෙනස් විය හැකි ය.

10 - 689

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2026

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/CAD/MOH/CM/Vol.V හා 2026.09.23 දිනැති ලිපිය හා අංක 2199/10 හා 2020.10.27 දිනැති ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාව හා සංශෝධනවලට අනුකූලව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර ගණයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි පුරප්පාඩු තනතුරු 177 ක් සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

ඒ අනුව මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් 2026 නොවැම්බර් මස 16 දිනට සපුරාලන සුදුස්සන් තෝරා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ආයුර්වේද කොමසාරිස් ජනරාල්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ **''ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2026"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. තව ද, බඳවා ගැනීමේ අයදුම්පත්‍රයේ සඳහන් කරන නම සිංහල මාධ්‍ය අයදුම්කරුවන් විසින් සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි බසින් ද, දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් විසින් දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි බසින් ද සඳහන් කළ යුතු ය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026 නොවැම්බර් මස 16 දින වේ.

සටහන : අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් ම විඳදරා ගත යුතු ය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආයුර්වේද/ සිද්ධ/ යුනානි උපාධිය ලත් උපාධිධාරීන් අදාළ වර්ෂවල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන කුසලතා ලේඛනයේ අනුපිළිවෙල පදනම් කරගෙන බඳවාගනු ලැබේ. වසර කිහිපයකට අදාළ උපාධිධාරීන් අයදුම්කරුවන් ලෙස ඉදිරිපත් වන අවස්ථාවක දී ඒ ඒ වර්ෂයන්හි කුසලතා ලේඛනය පදනම් කර ගනිමින් එම කුසලතා ලේඛනයෙහි සඳහන් අනුපිළිවෙලට ප්‍රමුඛතාවය දෙමින් පත්කිරීම් බලධරයා විසින් පත් කරන ලද සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

02. බඳවා ගන්නා ශ්‍රේණිය : ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණිය

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු ය.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමෙන් පසු උසස් කිරීම් සිදුකරනුයේ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ දැක්වෙන නියමයන් හා කොන්දේසිවලට අනුකූලව ය.

III. නවක පත්වීම්ලාභීන් ඔවුන්ගේ කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු පවතින සේවා ස්ථාන වෙත ස්ථානගත කරනු ලබන අතර, මුල් පත්වීම අනුව වැඩ භාරගත් නිලධාරීන් සිය මුල් සේවා ස්ථානයේ අනිවාර්ය වසර දෙකක (02) සේවා කාලය අවසන් වන තෙක් සේවය කළ යුතු ය. එම කාලය තුළ ස්ථාන මාරුවීම් අපේක්ෂා නොකළ යුතු අතර මෙම කාලය තුළ ස්ථාන මාරු ලබා දීමට ද කටයුතු නොකෙරේ.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, අංක 2199/10 හා 2020 ඔක්තෝබර් මස 27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ ඇතුළත් නියමයන් සහ කොන්දේසි වලට ද, රජයේ මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම යටත් වේ.

04. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රු. 91,750-3x2,400-7x2,420- 2x2,490-16x3,900- රු. 184,170/- (SL-2-2025) මාසික වැටුප් පරිමාණයක් හිමි ය.

05. වයස් සීමාව : 2026 නොවැම්බර් මස 16 දිනට

අවම සීමාව : අවුරුදු 22යි
උපරිම සීමාව : අවුරුදු 45යි

06. සුදුසුකම් :

I. අධ්‍යාපන සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ආයුර්වේද / සිද්ධ/ යුනානි වෛද්‍ය විද්‍යාව පිළිබඳ පස් අවුරුදු උපාධියකින් පසුව එක් අවුරුදු සීමාවාසික රෝහල් පුහුණුවක් ලබා තිබීම.

II. වෘත්තීය සුදුසුකම් : ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය ලබා තිබීම.

III. පළපුරුද්ද : අදාළ නොවේ.

IV. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම පුදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු යි.

V. වෙනත් සුදුසුකම් :

- අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු යි.

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉල්ලා සිටින විටෙක ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් සූදානම්ව සිටිය යුතු ය:-

(i) උප්පැන්න සහතිකය;
(ii) සවිස්තරාත්මක උපාධි සහතිකය;
(iii) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය;
(iv) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය;
(v) ජාතික හැඳුනුම්පත.

08. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආකෘතියක් මෙම නිවේදනයේ අවසානයේ දැක් වේ. අයදුම්පත්‍රය සෙ. මී. 22x29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, අංක 01 සිට 08 තෙක් ශීර්ෂ පළමු පිටුවට ද, අංක 09 සිට

11 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු බවත් ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අදාළ අයදුම්පත්‍රයේ ආකෘතියක් www.ayurveda.gov.lk මගින් ද ලබා ගත හැක.

09. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් සාවද්‍ය බවට බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය දැනුම් දීමකින් තොරව අවලංගු කරනු ලැබේ.

එබඳු සාවද්‍ය තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව වුව ද අනාවරණය වුවහොත් ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව සතු වේ.

11. මෙම නිවේදනයෙහි විධිවිධාන සැලසී නොමැති කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් තීරණය කරනු ලැබේ.

12. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියෝගය පරිදි,

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 ඔක්තෝබර් මස 17 වැනි දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුර සඳහා අයදුම්පත - 2026

01. I (අ) අගට යෙදෙන නම මුලකුරු සමග (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -
.....

(ආ) අගට යෙදෙන නම මුලකුරු සමග (සිංහලෙන්/දෙමළෙන්) -
.....

II (අ) මුලකුරුවලින් කියවෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -
.....

(ආ) මුලකුරුවලින් කියවෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) -
.....

III වෛද්‍ය උපාධි සහතිකයේ සඳහන් නම (ඉංග්‍රීසියෙන්)
.....

02. I ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(ලිපි එවනු ලබන්නේ මෙම ලිපිනයට ය.)
.....

II ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) -
.....
.....

03. ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

04. I. උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | |

II. 2026 නොවැම්බර් මස 16 දිනට වයස : අවුරුදු | | මාස | | දින | |

05. ස්ත්‍රී / පුරුෂභාවය : (අදාළ කොටුවේ X ලකුණ යොදන්න) ස්ත්‍රී | | පුරුෂ | |

06. විවාහක ද/ අවිවාහක ද යන වග : (අදාළ කොටුවේ X ලකුණ යොදන්න) විවාහක | | අවිවාහක | |

07. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග :.....

08. ස්ථිර පදිංචි ස්ථානය අයත් -
I. පළාත් සභාව .....
II. දිස්ත්‍රික්කය .....
III. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය .....

09. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

10. අධ්‍යාපන සුදුසුකම් :
උපාධි පිළිබඳ විස්තර

බී. ඒ. එම්. එස්. (BAMS) | | බී. යූ. එම්. එස් (BUMS) | | බී. එස්. එම්. එස් (BSMS) | |

(අදාළ කොටුවේ X ලකුණ යොදන්න)

1. විශ්වවිද්‍යාල ආයතනය .....
2. අධ්‍යයන වර්ෂය ..... (උදා : 2018/2019)
3. උපාධිය වලංගු වන දිනය .....
4. පංතිය .....
5. උපාධිය සම්පූර්ණ කළ මාධ්‍යය .....
6. ප්‍රායෝගික පුහුණුව ලැබූ වර්ෂය .....

11. ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය පිළිබඳ විස්තර :
1. අංකය .....
2. වර්ෂය .....

මෙම ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති විස්තර සත්‍ය බව ද, නිවැරදි බව ද, මම මෙයින් සනාථ කරමි. මා ආයුර්වේද වෛද්‍ය නිලධාරි තනතුරට බඳවා ගැනීමෙන් පසුව මෙහි ඇතුළත් යම් විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව පත්වීම් බලධාරියාට අනාවරණය වුවහොත් ඒ හේතුවෙන් මා එම තනතුරට නුසුදුසු වීමට ද කිසියම් වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව මම දනිමි.

....
දිනය අත්සන

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සහතික කරනු ලැබිය යුතු ය.

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ..... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත් ..... දින ඔහුගේ/ ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් සහතික කරමි.

....,
දිනය අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතු ය.)

ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් ආයතන ප්‍රධානියාගේ වාර්තාව

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත් ඔහු/ ඇයගේ වැඩ, හැසිරීම සහ පැමිණීම ..... බවත් සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ ඇය මුදාහැරිය හැකි ය./ නොහැකි ය.

....,
දිනය අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතු ය.)

10 - 741

විගණන සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විධායක සේවා ගණයේ I පන්තියේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති තනතුර සඳහා සෘජු ධාරාව මත බඳවා ගැනීම - 2026

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විධායක සේවා ගණයේ I පන්තියේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති තනතුරට සෘජු ධාරාව මත බඳවා ගැනීම සඳහා (පුරප්පාඩු සංඛ්‍යාව 02 කි) අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **බඳවා ගැනීමේ ක්‍රමය**:-

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ලබා ගන්නා ලකුණු අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පරිශිෂ්ටය 03 හි සඳහන් පරිදි පහත නිර්ණායකයන්ට යටත්ව (අංක 5 යටතේ සඳහන්) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුව ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර	*උපරිම ලකුණු ප්‍රමාණය*
අතිරේක අධ්‍යාපන සුදුසුකම්	25
අතිරේක වෘත්තීය සුදුසුකම්	20
තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද	40
තොරතුරු තාක්ෂණය/පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම්	05
සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය	10
එකතුව	**100**

සටහන :- බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.
පත්වීම ක්‍රියාත්මක වන දිනය විගණන සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ .

2. **අවශ්‍ය සුදුසුකම්** :- සෑම අයදුම්කරුවකුම අයදුම්පත් කැඳවන අවසාන දිනට පහත සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

I. **අධ්‍යාපන සුදුසුකම්** :- අදාළ නොවේ.

II. **වෘත්තීය සුදුසුකම්** :-

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය.

III. **පළපුරුද්ද**:-

බාහිර අයදුම්කරුවෙක් නම් - අදාළ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර දොළහක (12) සේවා පළපුරුද්දක් ලබා තිබීම;

හෝ

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ නියුතු අයදුම්කරුවෙක් නම් - විධායක මට්ටමේ තනතුරක වසර දොළහක (12) සේවා පළපුරුද්දක් ලබා තිබීම. (පළපුරුද්ද සම්බන්ධයෙන් සේවා කාලය ගණන් ගැනීමේදී අඩ වැටුප් සහිත සහ වැටුප් රහිත නිවාඩු සැලකිල්ලට ගනු නොලැබෙන අතර පළපුරුද්ද සලකා බලනු ලබන කාලය තුළදී ඔහු හෝ ඇය කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවී තිබිය යුතු ය.)

IV. **ශාරීරික යෝග්‍යතාව**:-

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

V. **වෙනත් සුදුසුකම්**:-

(i). ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
(ii). විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.
(iii). යම් ආගමික පැවිදිවරයක් දරන තැනැත්තකු නොවීම.
(iv). අයදුම්පත් කැඳවනු ලබන නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනට සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

VI. **වයස**:-

2026 නොවැම්බර් 23 දිනට වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර එදිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඒ අනුව 1981.11.23 දින සිට 1991.11.23 දින දක්වා එම දින ද ඇතුළත්ව උපන් දිනය යෙදෙන අයට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. (රාජ්‍ය සේවයේ නියුක්ත නිලධරයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ සේවා කොන්දේසි** :-

(i). මෙම තනතුර ස්ථීර ය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii). මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. රාජ්‍ය සේවයේ ස්ථීර තනතුරක් දරන නිලධරයකු මෙම තනතුරට පත් කරනු ලැබුවහොත් වසරක පරිවාස කාලයකට යටත් වේ. එසේ වුවද එම නිලධරයාගේ පූර්ව සේවා කාලය හා පළපුරුද්ද නව තනතුරට අයත් සුදුසුකමක් නොවන කල්හි අවුරුදු තුනක පරිවාස කාලයට යටත්වේ. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් ආකාරයට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii). 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත් වී වසර තුනක් ඉකුත්වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේක ව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

(iv). රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v). ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

4. **වැටුප් පරිමාණය** :- 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 86,950- 10 x 2,400 - 8 x 2,940 - 17 x 3,900 - රු.200,770/- (පියවර 20) වේ. ඒ අනුව මෙම තනතුරට හිමි වැටුප් ක්ෂේතය AS 03

- 2025 වන අතර ආරම්භක වැටුප් පියවර රු.138,370/- වේ. (2027.01.01 දින තෙක් ඔබට වැටුප් ගෙවනුයේ එම වක්‍රලේඛයේ උපලේඛන III අනුවය.) මෙයට අමතරව තනතුරට අදාළ වන පරිදි රජය විසින් අනුමතකර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

5. වාසගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු ලබා දීමේ පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

අනු අං.	*විෂය*	*ලකුණු*	*උපරිම ලකුණු*
I.	**අතිරේක අධ්‍යාපන සුදුසුකම්**		25
	(*අ*) **සාමාන්‍ය උපාධිය**	10	
	(*ආ*) **විශේෂ උපාධිය**	11	
	(*ඇ*) **2 වැනි පන්තිය සහිත සාමාන්‍ය උපාධිය**	11	
	(*ඈ*) **2 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය**	13	
	(*ඉ*) **1 වැනි පන්තිය සහිත සාමාන්‍ය උපාධිය**	13	
	(*ඊ*) **1 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය**	15	
	(*උ*) **පශ්චාත් උපාධි ඩිප්ලෝමාව** (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය තොරතුරු තාක්ෂණ, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර)	18	
	(*ඌ*) **MA/MSC** හෝ ඒ හා සමාන වෙනත් උපාධියක් (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය තොරතුරු තාක්ෂණ, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර)	20	
	(*එ*) **ඉහත (ඌ) හි සඳහන් උපාධියකට වඩා ඉහළ උපාධිය** (රාජ්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය තොරතුරු තාක්ෂණ, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර)	25	
II.	**අතිරේක වෘත්තිය සුදුසුකම් :** (මූලික වෘත්තිය සුදුසුකමට අමතරව ලබා ඇති ඉහළම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)		20
	(අ) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ / ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාව	07	
	(ආ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික II /අන්තර්මාධ්‍ය පරීක්ෂණය / ගිණුම්කරණ හා ව්‍යාපාර සහතික පත්‍රය II / ව්‍යාපාර අදියර/ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ II අදියර පරීක්ෂණය සමත් වීම	09	
	(ඇ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන I කොටසේ පරීක්ෂණය / වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ III අදියර පරීක්ෂණය සමත් වීම	12	
	(ඈ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්ව	15	
	(ඉ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය	20	

අනු අං.	*විෂය*	*ලකුණු*	*උපරිම ලකුණු*
III.	**තොරතුරු නාක්ෂණය / පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් :** විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයකින් පිරිනමනු ලබන මාස 6ක හෝ ඊට වැඩි කාලයක පරිගණක සහතික පත්‍ර පාඨමාලාවක් සමත්ව තිබීම හා සහතිකයක් ලබා තිබීම.	05	05

ඉහත සටහනට අමතරව තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද සඳහා වසරකට ලකුණු 05 බැගින් **උපරිම ලකුණු 40 ක් ද**, සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා **උපරිම ලකුණු 10 ක් ද** වෙන් කර ඇත. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු අනුපිළිවෙළ අනුව බඳවා ගැනීම් සිදු කෙරේ.

6. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය** :-

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i). පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
(ii). වලංගු විදේශ ගමන් බලපත්‍රය.

7. **අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය** :-

(i). අයදුම්පත් **"ලේකම්, විගණන සේවා කොමිෂන් සභාව, අංක 415, කොටා පාර, රාජගිරිය"** යන ලිපිනය සඳහන් කර **2026 නොවැම්බර් 23** දින හෝ එදිනට පෙර හෝ ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii). ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට අංක 04 දක්වාත් දෙවැනි පිටුව අංක 05 සිට අංක 08 දක්වාත් තෙවැනි පිටුව අංක 09 සිට අංක 10 දක්වාත් වන ආකාරයට පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii). අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ **"සෘජු ධාරාව මත ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති තනතුරට බඳවා ගැනීම"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(iv). අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන විධායක ශ්‍රේණියේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v). අයදුම්පතක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් පමා කරන අයදුම්කරුවන් ඉන් සිදු විය හැකි ප්‍රතිවිපාක තමන් විසින් ම විඳ දරා ගත යුතු ය.

(vi). විදේශගත ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ට තම අයදුම්පත් විගණන සේවා කොමිෂන් සභා ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි රටට නැතහොත් ආසන්නම රටට පත් කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට ස්වකීය අභිමතය පරිදි පිළිවන.

(vii). වෛද්‍ය පරීක්ෂණ සඳහා යානාපත්‍ර - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යටතේ සේවය සඳහා පත් කරනු පිණිස පිටරටින් නෝරාගනු ලබන ශ්‍රී ලාංකික අයදුම්කරුවෙක් වේ නම්, ඔහු සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා වන ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ යානාපත්‍ර වියදමත් එම අයදුම්කරු විසින් ම දැරිය යුතු ය.

(viii). රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානියාගේ මාර්ගයෙන් නියමිත දින හෝ එදිනට පෙර ලැබෙන සේ මා වෙත ඉදිරිපත් කළ යුතු අතර, මෙම කාර්යාලයේ කිසිදු නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතු ය.

(ix). මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(x). අයදුම්පත්‍රය සමඟ පහත ලේඛනවල ඡායා පිටපතක් බැගින් අමුණා එවිය යුතු අතර වෙනත් කිසිදු ලේඛනයක් නොඇමිණිය යුතු ය.

(a) ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත,

(b) උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත,
(*සැ.යු :-* බෞතීස්ම සහතික හෝ උපකෘත පාසල් පිළිබඳ රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ පිළිගනු නොලැබේ.)

(c) සාමාන්‍ය උපාධිය සහ එයට ඉහළ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්),

(d) ප්‍රධාන වෘත්තීය සුදුසුකම් (මෙම නිවේදනයේ 2. II පරිදි) සහ අතිරේක වෘත්තීය සුදුසුකම් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්) සනාථ කෙරෙන සහතිකවල පිටපත්,

(e) තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්,

(f) තොරතුරු තාක්ෂණය හා පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම් (මෙම නිවේදනයේ අංක 5 යටතේ සඳහන්),

(g) චරිතය පිළිබඳව සඳහන් වන මෑතකදී ලබාගත් සහතික දෙකක්,
(දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට අදාළ නොවේ.)

සටහන - සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අදාළ ලේඛනවල මුල් පිටපත්, අයදුම්පත්‍රයට අමුණා ඇති සහතික කරන ලද පිටපත් සනාථ කර ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

8. **සාවද්‍ය තොරතුරු සැපයීම:-**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත් ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. පුරප්පාඩු පිරවීමේ හා නොපිරවීමේ අයිතිය විගණන සේවා කොමිෂන් සභාව සතු වේ.

10. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

විගණන සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩී.කේ. විජේසිංහ,
ලේකම්,
විගණන සේවා කොමිෂන් සභාව.

2026 ඔක්තෝබර් මස 23 දින,
අංක 415, කොටා පාර,
රාජගිරිය.
විගණන සේවා කොමිෂන් සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

විගණන සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ විධායක සේවා ගණයේ I පන්තියේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති තනතුර සඳහා ඍජු ධාරාව මත බඳවා ගැනීම - 2026

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

(අයදුම් කරන මාධ්‍යය සහ අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල-2 / දෙමළ- 3/ ඉංග්‍රීසි-4

සටහන : අයදුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කළ නොහැක.

---

01. (i) සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : .....
(සිංහලෙන්/ දෙමළෙන්)

(ii) සම්පූර්ණ නම: .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(iii) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම: .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):
උදා : GUNAWARDHANA, M.G.B.S.K.

02. (i) ස්ථිර ලිපිනය : .....

(ii) දුරකථන අංකය: ස්ථාවර :

ජංගම :

03. (i) ස්ත්‍රී / පුරුෂ භාවය : .....

(ii) විවාහක / අවිවාහක බව : .....

04. (i) උපන් දිනය :
වර්ෂය: ..... මාසය : ..... දිනය : .....

(ii) **2026 නොවැම්බර් 23 දිනට** වයස:
අවුරුදු : ..... මාස : ..... දින : .....

(iii) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද යන වග? .....

(iv) ජාතිය: .....

(v) ජාතික හැඳුනුම්පත් අංකය :

05. (i) මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති අධ්‍යාපන සුදුසුකම්:

විභාගය	*වර්ෂය*	*විෂයයන්*

(ii) මෙම තනතුර සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ලබාගෙන ඇති වෘත්තීය සුදුසුකම්:

සුදුසුකම	*වර්ෂය*	*ආයතනය*

(iii) මෙම තනතුරට අයදුම් කිරීම සඳහා ලබාගෙන ඇති ක්ෂේත්‍ර පළපුරුද්ද:

තනතුර	*ආයතනය*	*කාල සීමාව*

(iv) භාෂා ප්‍රවීණතාවය :

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

06. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :

(i) තනතුර : .....

(ii) දෙපාර්තමේන්තුව/ ආයතනය : .....

(iii) පත් වූ දිනය : .....

(iv) ස්ථිර ද, විශ්‍රාම වැටුප් සහිත ද, තාවකාලික ද, නැතහොත් කොන්ත්‍රාත් පදනම් මත ද යන වග: .....

(v) වාර්ෂික වැටුප් පරිමාණය : .....

(vi) දැනට ලබන වාර්ෂික වැටුප : .....

07. ඔබ ගැන තොරතුරු විමසා දැනගත හැකි පුද්ගලයන් දෙදෙනෙකුගේ නම, ලිපිනය, තනතුර/රැකියාව සහ දුරකථන අංකය සඳහන් කරන්න.

(i) .....
.....

(ii) .....
.....

08. අයදුම්කරුගේ සහතිකය:

මෙම අයදුම්පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්,

පත්කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත්, මම දැන සිටිමි.

.....

දිනය : ..... අයදුම්කරුගේ අත්සන.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ..... මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, 2026 ..... මස ..... වැනි දින ඔහු / ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් ප්‍රකාශ කරමි.

.....
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය : .....
ස්ථානය : .....
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10. අයදුම්කරු රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නිරත නම්, ඔහු පිළිබඳව ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ..... නමැති අයදුම්කරු / අයදුම්කාරිය .....වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ / ඇයගේ සේවය සතුටුදායක බවත්, අයදුම්කරු / අයදුම්කාරිය සේවයේ ස්ථීර කර ඇති /නැති බවත්, ඉහත 05 හි සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, ... දින ඔහු / ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, මෙයින් සහතික කරමි.

.....

දිනය:..... රාජ්‍ය /පළාත් රාජ්‍ය ආයතන ප්‍රධානියාගේ හෝ ඔහුගේ බලයලත් නිලධාරියාගේ අත්සන.

10 - 742

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ ප්‍රධාන කර්තෘ තනතුර සහ සිංහල විශ්වකෝෂ කාර්යාලයේ ප්‍රධාන කර්තෘ තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ ප්‍රධාන කර්තෘ තනතුර සහ සිංහල විශ්වකෝෂ කාර්යාලයේ ප්‍රධානා කර්තෘ තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම සඳහා 2026.09.25 දින *රජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ 02. ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.11.06 දින හෝ ඊට පෙර ලැබෙන සේ සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ලේකම්,
බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
2026 ඔක්තෝබර් මස 19 දින දී ය.

10 - 754

විභාග, විභාග ප්‍රතිඵල ආදිය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ විභාග දත්ත සහකාර තනතුරේ (දෙපාර්තමේන්තුගත) III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන- ඛණ්ඩ 2 සේවා ගණයේ විභාග දත්ත සහකාර (දෙපාර්තමේන්තුගත) – III ශ්‍රේණියේ තනතුර සඳහා පවත්නා පුරප්පාඩු 23ක් පිරවීම සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

සටහන **-** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/CAD/EXAM/CM හා 2026.06.26 දිනැති ලිපිය මගින් මෙම බඳවාගැනීම් සඳහා අනුමැතිය ලැබී ඇත.

01. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment / E.B. Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත **අයදුම්පත් භාර ගැනීම 2026 ඔක්තෝබර් මස 26 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 නොවැම්බර් මස 20 වැනි දින ප.ව. 09.00ට අවසන් වේ.** මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව 2027 පෙබරවාරි මස කොළඹ දී පමණක් පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

1.1. දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

1.2. අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

02. සුදුසුකම් :

2.1 අධ්‍යාපන සුදුසුකම් :

I. සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථ්‍ය සහිතව එකවර විෂයයන් භයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත් වී තිබීම;

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂය හැර) සමත් වී තිබීම.

2.2 වෘත්තීය සුදුසුකම් :

අවම වශයෙන් පරිගණක / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 3 මට්ටම හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන වෙනත් සුදුසුකම් ලබා තිබීම.

2.3 පළපුරුද්ද :

පරිගණක දත්ත ඇතුළත් කිරීමේ කටයුතු සම්බන්ධ මාස 06ක පළපුරුද්ද

2.4 කායික සුදුසුකම් :

තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත වීම මෙන්ම සේවයේ අවශ්‍යතාව මත දිවා රාත්‍රී සේවය කිරීමේ හැකියාව ද අපේක්ෂා කෙරේ.

2.5 වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.
II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2026.11.20) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.
IV. කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිම තැනැත්තකුට මෙම තරඟ විභාගය සඳහා අයදුම්කිරීමට හෝ පෙනී සිටීමට අවසර නොමැත.

2.6 වයස් සීමාව :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

(ඒ අනුව 2008.11.20 දින හෝ ඊට පෙර හා 1991.11.20 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

03. භාෂා මාධ්‍යය :

මෙම විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. තම අයදුම්පතෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩදෙනු නොලැබේ. තව ද, ඔබ පත්වීම් ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

04. බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත විභාගයෙන්, ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් අපේක්ෂකයන් ලබාගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට අදාළව තනතුරට බඳවාගනු ලැබේ.

4.1. ලිඛිත විභාගය :

විෂයය	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
1. පරිගණක සාක්ෂරතාව	පැය 2	100	40%

විෂය නිර්දේශය :

1. පරිගණක සාක්ෂරතාව - පරිගණක / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 3 මට්ටමේ විෂය ක්ෂේත්‍රයට අදාළ දැනුම පිළිබඳ විමසා බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

සටහන - ලිඛිත විභාගයේ ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ විභාග අංක / අකාරාදී අනුපිළිවෙළට ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

4.2 ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය :

මෙහිදී අපේක්ෂකයාගේ අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා ප්‍රායෝගික කුසලතා පරීක්ෂා කරනු ලැබේ.

ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය*
අතිරේක අධ්‍යාපන සුදුසුකම්	30	අදාළ නොවේ.
අතිරේක වෘත්තීය සුදුසුකම්	35	
සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව	05	
මුළු ලකුණු	70	

සටහන - ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයක් ඇතුළත, එක් එක් ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත.

4.3. ප්‍රායෝගික පරීක්ෂණය :

ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන්ගේ යතුරුලියන හැකියාව පරීක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් ද පවත්වනු ලැබේ. එහිදී ඡේද කිහිපයකින් යුත් දෙන ලද ලේඛනයක් නියමකර ගත් නිශ්චිත කාලයක් තුළ පරිගණකය මගින් යතුරුලියනය කර එහි මුද්‍රිත පිටපතක් ලබා ගැනීම පරීක්ෂා කරනු ලැබේ.

පරීක්ෂණයට භාජනය කරනු ලබන කාර්යයන්	*ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය*
දෙන ලද ලිපියේ ආකාරයටම අදාළ මුද්‍රිත පිටපත ලබාගැනීම	10
යතුරු ලියනයට හා අදාළ මුද්‍රිත පිටපත ලබාගැනීමට ගතවන කාලය	10
එහි නිවැරදි අක්ෂර වින්‍යාසය වෙනුවෙන්	10
මුළු ලකුණු	30

4.4. ලිඛිත විභාගයෙන්, ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවතින

පුරප්පාඩු සංඛ්‍යාවට අදාළව තනතුරට බඳවාගනු ලැබේ.

05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

II. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට පත් වී වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ආකාරයට I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය. එම කාලය තුළ වැඩ, පැමිණීම, හැසිරීම සතුටුදායක මට්ටමට වඩා ඉහළ පැවතීම හා අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරා ඇත්නම් නියමිත තනතුරේ ස්ථිර කරනු ලැබේ.

III. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත් වී වසර තුනක් ඉකුත් වීමට පෙර සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව ලබාගත යුතු ය.

IV. මෙම තනතුර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවටම සීමා වූ සේවාවකි. එසේ වුව ද දෙපාර්තමේන්තුව තුළ දිවයිනේ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීම සඳහා පත් කරනු ලැබිය හැකිය. සේවා අවශ්‍යතාව මත දිවා රාත්‍රී වැඩමුර දිගටම පවතින බැවින් අදාළ පත්වීම භාරගත් පසු ඒ අනුව කටයුතු කිරීම අනිවාර්ය වේ.

V. තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද යටත් විය යුතු ය.

06. **ප්‍රතිඵල නිකුත් කිරීම** : විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මගින් හෝ සිදු කරනු ලැබේ.

07. **වැටුප් පරිමාණය (මාසික)** : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025හි MN-01-2025 යටතේ රු. 45,230 - 10× 540 - 11× 630 - 10× 890 - 10× 1,190 - 78,360/-

08. උසස් කිරීමේ පරිපාටිය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ විභාග දත්ත සහකාර (දෙපාර්තමේන්තුගත) තනතුරේ බඳවා ගැනීම් පරිපාටිය අදාළ වේ.

09. අයදුම් කිරීමේ ක්‍රමය :

I. අයදුම්පත් භාර ගන්නේ මාර්ගගතව පමණි. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. මාර්ගගත අයදුම්පත භාරගන්නා ලද බව / භාර නොගන්නා බව ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් පසුව කරනු ලබන විමසීම්වල දී ඉදිරිපත් කිරීමට ළඟ තබා ගත යුතු ය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මාර්ගගත පද්ධතියේ ඇති තොරතුරු නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. අයදුම්කරු විසින් විභාග ගාස්තු වශයෙන් රු.600/-ක මුදලක් ගෙවිය යුතු ය. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
II. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සක්‍රීය කර ඇති බැංකු හර කාඩ්පතක් මගින් (Bank Debit Card with Internet Payment Facility)
III. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Bank of Ceylon Online Banking Method/ Flex App)
IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon any Branch

සටහන - ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් විභාග දෙපාර්තමේන්තුවේ

වෙබ් අඩවියේ විභාගයට ආදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

III. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

IV. විභාගය සඳහා ගෙවන ලද මුදල් කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ.

V. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව වෙබ් නිවේදනයක් මගින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් (SMS) මගින් දැනුම් දීමට කටයුතු කෙරේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක්, වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානම්න් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

VI. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

VII. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

- ජාතික හැඳුනුම්පත;
- වලංගු විදේශ ගමන් බලපත්‍රය;
- වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව සහ විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

10. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට / ඇයට සිදුවනු ඇත.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

2026 ඔක්තෝබර් මස 23 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 686

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම් සපුරා ඇති වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් **2027 පෙබරවාරි මස කොළඹ දිස්ත්‍රික්කයේ දී** පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

- ❖ අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.donets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/E.B.Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 ඔක්තෝබර් මස 26 දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2026 නොවැම්බර් 25 වැනි දින රාත්‍රී 9.00 ට අවසන් වේ.**
- ❖ නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.
- ❖ අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

1.0 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු :

අනු. අංකය	*තනතුරු නාමය*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*බඳවා ගන්නා ශ්‍රේණිය*
1.	සැලසුම් ශිල්පී	39	පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා)
2.	විදුම් සහකාර	02	
3.	පර්යේෂණ සහකාර (සාමාන්‍ය)	01	
4.	සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක	06	
5.	පාංශු ප්‍රස්ථාරක	01	
6.	ජල විද්‍යා සහකාර	03	
7.	ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර	01	
8.	පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය)	01	
9.	පස් සමීක්ෂක	04	
10.	පර්යේෂණ සහකාර (ජලශක්ති)	01	
11.	යාන්ත්‍රික මූලික	04	III ශ්‍රේණිය

1.1. තනතුරුවල රාජකාරී ස්වභාවය :

අනු. අංකය	*තනතුරු නාමය*	*පැවරෙන කාර්යයන්*
1.	සැලසුම් ශිල්පී	1) ඉංජිනේරු කාර්ය මණ්ඩලය විසින් දෙනු ලබන නිර්මාණ සටහන්, මූලික පරාමිති, කෙටුම්පත් සටහන් ඇසුරෙන් විස්තරාත්මක සැලසුම්පත් පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම : බිම් මැනුම් තලමිති මැනුම් ආශ්‍රයෙන් පිඹුරුපත්, සමෝච්ච රේඛා සිතියම්, දික්කඩ හරස්කඩ සැලසුම්පත් පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම, වාරිමාර්ග ව්‍යාපාරවල ඉඩම් කට්ටි කිරීමේ සැලසුම්පත්, ඉඩම් පවරා ගැනීමේ සැලසුම්පත්, මෙහෙයුම් නඩත්තු සැලසුම්පත් ආදිය පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම.

අනු. අංකය	*තනතුරු නාමය*	*පැවරෙන කාර්යයන්*
		2) ප්‍රමාණ ගණනය : ගාස්තු සඳහා මිල විශ්ලේෂණය : ප්‍රමාණ බිල්පත් පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම 3) වැඩ ඇස්තමේන්තු පරීක්ෂා කිරීම. වැඩ ඇස්තමේන්තු අනුසාරයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ පෝරම, උප ලේඛනය පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම : වැඩ සඳහා ගෙවීම් කිරීමට අදාළ මිනුම් පොත්, ගෙවීම් බිල්පත්, අවසන් ගෙවීම් වාර්තා හා සැලසුම්පත් පරීක්ෂා කිරීම. 4) වාරිමාර්ග ව්‍යාපාරවල තාක්ෂණික මෙහෙයුම් හා මනා දත්ත පිළිබඳ ලේඛන නඩත්තුව : ප්‍රගති වාර්තා සටහන් පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම. 5) සැලසුම්පත්, පිඹුරුපත් සහ අනෙකුත් සැලසුම් කාර්යාලීය ලේඛන ද්‍රව්‍ය හා උපකරණවල භාරකාරත්වය හා නඩත්තුව. විධායකය/ කළමනාකරණය විසින් පවරනු ලබන අනෙකුත් සැලසුම් ශිල්පීය රාජකාරී
2.	විදුම් සහකාර	• මධ්‍යම හා මහා පරිමාණ ඉදිකිරීම් සඳහා භූමියේ ශක්තිමත්භාවය, භූගත ජල කාන්දුවීම් ආදිය පරීක්ෂා කිරීමේ කටයුතු. • විශාල ඉදිකිරීම්වල අත්තිකාරම් සඳහා විවිධ ගැඹුරු මට්ටම්වලින් පාෂාණ හා පස් තට්ටුවල සාම්පල ලබා ගැනීම. • පාෂාණ ස්ථරවල කාන්දුවීම නැවැත්වීම හා ඒවා ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම. • නිම කරන ලද ඉදිකිරීම්වල සිමෙන්ති හා රසායනික ද්‍රව්‍ය කාවැද්දීම මඟින් ද මතුපිට යන්ත්‍ර මඟින් කොන්ක්‍රීට් ආස්තරණ යෙදීම මඟින් ද ජල කාන්දුවීම හා වෙනත් දුර්වලතාවලට පිළියම් යොදා ශක්තිමත් කිරීමේ කටයුතු කිරීම. • ඉහත කාර්යයන්ට අදාළ වාර්තා ඉදිරිපත් කිරීම. ඉහත කාර්යයන්ට අවශ්‍ය වන විදුම් යන්ත්‍ර ,ජල පොම්ප හා වෙනත් උපකරණ ද ඒවාට අදාළ ඩීසල් හා පෙට්‍රල් යන්ත්‍ර ක්‍රියාකරවීම, නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම.
3.	පර්යේෂණ සහකාර (සාමාන්‍ය)	1) දැනට කෙරෙමින් පවතින හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වාරිමාර්ග හා වෙනත් සංවර්ධන ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය වන පස් හා ජල සාම්පලවල භෞතික හා රසායන ගතිගුණ නිර්ණය සඳහා විශ්ලේෂණ කිරීම. 2) ද්‍රාවන හා ප්‍රතිකාරක නිරවද්‍ය ලෙස පිළියෙල කිරීම, එදිනෙදා විශ්ලේෂණ කාර්යන්හිදී භාවිත වන නවීන සූක්ෂම ඉලෙක්ට්‍රොනික් විද්‍යුත් හා විද්‍යුත් යාන්ත්‍රික උපකරණ නිසි ලෙස භාවිත කිරීම, නිරවද්‍යව අංක ශෝධනය කිරීම හා මැනවින් නඩත්තු කිරීම, විශ්ලේෂණ මඟින් ලබා ගන්නා දත්ත සම්පාදනය කිරීම.

අනු. අංකය	*තනතුරු නාමය*	*පැවරෙන කාර්යයන්*
4.	සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක	• වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරි ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂණ කටයුතු කිරීම, එම ක්ෂේත්‍රයේ ඉංජිනේරුමය ද්‍රව්‍ය සඳහා තත්ත්ව පාලන කටයුතුවල (පස් සහ කොන්ක්‍රීට් ද්‍රව්‍යයන්හි ගතිගුණ හා ශක්තීන් පිළිබඳ) නිරතවීම හා එම ප්‍රමිතීන් සහතික කිරීම. • රාජ්‍ය හා පුද්ගලික ආයතනවල ඉල්ලීම මත කෙරෙන ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණ කටයුතුවල නිරතවීම.
5.	පාංශු ප්‍රස්ථාරක	• පාංශු සමීක්ෂණ හා පාංශු පරිශීලන සිතියම් ඒකාබද්ධ කිරීම හා රාශිභූත කිරීම. • ලබා දෙන්නා වූ දත්ත ආශ්‍රයෙන් සිතියම් ඇඳීම හා සිතියම් වර්ණ ගැන්වීම. • දළ පාංශු සිතියමට (Draft Soil Map) පාංශු සිතියම (Final Soil Map) පිළියෙල කිරීම. • ගුවන් ඡායාරූප, ඉංජිනේරු මිනුම්පත් ආදිය ඇසුරෙන් ඉඩම් වර්ගීකරණ පාංශු හා ඉඩම් පරිහරණය ආදී සිතියම් පිළියෙල කිරීම. සිතියම් වර්ණ කිරීම හා ක්ෂේත්‍ර ඵලයන් ගණනය කිරීම, සිතියම් විශාල කර ඇඳීම සහ කුඩා කර ඇඳීම, විවිධ පස් පැතිකඩ භූ දර්ශන ඇඳීම,මෙම අංශයෙන් නිකුත් කළ වාර්තාවලට රූප සටහන් ප්‍රස්ථාර ආදිය ඇඳීම, වර්ණ සිතියම් නිෂ්පාදනයට අවශ්‍ය දෑ පිළියෙල කිරීම. • පරිගණක ආශ්‍රිත මෘදුකාංග භාවිතයෙන් පාංශු සිතියම් පිළියෙල කිරීම.
6.	ජල විද්‍යා සහකාර	ශ්‍රී ලංකාවේ දිවයින පුරා ජල ද්‍රෝණි හා ජලාශ ආශ්‍රිතව එක් රැස් කර ගන්නා වූ මූලික ජල විද්‍යාත්මක හා කාලගුණික දත්ත, විද්‍යාත්මක සිද්ධාන්ත ප්‍රායෝගිකව උපයෝගී කොට ගෙන ජල විද්‍යාත්මක අවශ්‍යතාව සඳහා ගණනය කිරීම, විශ්ලේෂණය කිරීම, දත්ත පරිගණකගත කිරීම, පරිගණක භාවිතයෙන් විශ්ලේෂණය කිරීම, දෛනික, මාසික, වාර්ෂික හා දිගුකාලීන වාර්තා පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම, මහජනතාවට හා අදාළ ආයතනවලට එම තොරතුරු පිළියෙල කිරීම : • එක් රැස් කර ගන්නා ජල විද්‍යාත්මක හා කාලගුණ දත්තවල නිරවද්‍යතාව ආරක්ෂා කිරීම හා ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සහ සහතික කර දත්ත බැංකුව නිරතුරුව පවත්වාගෙන යාම. • ගංහාවල ගංවතුර මට්ටම ඉහළ යාම නිර්ණය කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබාගෙන පරිගණකගත කිරීම හා නව ගණිතමය මාදිලි භාවිතයෙන් ගංවතුරට ලක්විය හැකි ප්‍රදේශ අධ්‍යයන කිරීම. • ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් ගංවතුර හානි මට්ටම් හා එම හානිවලට ලක්විය හැකි ප්‍රදේශ මිනුම්ගත කිරීම හා සිතියම් ගත කිරීම. • එම ප්‍රධාන ගංහාවල එවැනි ගංවතුරක් ඇතිවිය හැකි හෝ ඊට ආසන්න වන සෑම අවස්ථාවකදීම එම දත්ත නිරතුරුවම ලබා ගැනීම හා ඒ අනුව අනතුරු ඇඟවීම.

අනු. අංකය	*නනතුරු නාමය*	*පැවරෙන කාර්යයන්*
7.	ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර	ජල විද්‍යා අංශය මගින් තෝරා ගත් ගංගා නිම්න සඳහා ජල විද්‍යා ක්ෂේත්‍ර මිනුම් ඒකක පවත්වා ගෙන යාම හා අවශ්‍ය වන කාලගුණ දත්ත, වර්ෂාපතනය, ගංහාවල ගලා යන ජල මට්ටම් සහ අවට ඇති වැව්වල ජල ධාරිතාවන්හි වෙනස්වීම් ආදිය පිළිබඳ දත්ත එක් රැස් කිරීම : • එසේ ලබා ගන්නා ලද සියලුම ජල විද්‍යා හා කාලගුණ දත්ත පරීක්ෂා කර ලේඛන ගත කිරීම සඳහා මාසය අවසානයේදී ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම. • ගංහාවල හා අතු ගංහාවල එම ජල මට්ටම පවතින අවස්ථාවලදී ගලා යන ජල ධාරිතාව මිනුම් ගැනීම. ගංවතුර අනතුරක් ඇති විය හැකි අවස්ථාවලදී හෝ ඊට ආසන්න අවස්ථාවේදී ඒ සඳහා අනතුරු ඇඟවීම අවශ්‍ය වන ක්ෂේත්‍ර දත්ත නිරතුරුවම ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීම, ප්‍රධාන ගංවතුර අවස්ථාවලදී එම වේලාවන් සමග ගංවතුර මට්ටම් වෙනස්වීම් සටහන් කර ගැනීම.
8.	පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය)	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරි ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍යවල යෝග්‍යතාව පිළිබඳව දී ඇති පිරිවිතරවලට අනුව පර්යේෂණ කටයුතුවල නිරත වීම හා පර්යේෂණාත්මක සාධක මත ප්‍රමිතීන් සහතික කිරීම, එම ක්ෂේත්‍රයේ ඉංජිනේරුමය ද්‍රව්‍ය සඳහා තත්ත්ව පාලන කටයුතුවල (පස් සහ කොන්ක්‍රීට් ද්‍රව්‍යයන්හි ගතිගුණ හා ශක්තීන් පිළිබඳ) සේවයේ අවශ්‍යතාව මත නිරත වීම. රජයේ හා පුද්ගලික ආයතනවල ඉල්ලීම් මත කෙරෙන ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණ කටයුතුවල නිරත වීම හා එම ප්‍රමිතීන් සහතික කිරීම.
9.	පස් සමීක්ෂක	1) දැනට කෙරෙමින් පවතින හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වාරිමාර්ග හා වෙනත් සංවර්ධන ව්‍යාපෘති මෙම අංශය මගින් සිදු කරනු ලබන පස් සමීක්ෂණ කටයුතු ඉඩම් පරිහරණ කටයුතු සඳහා අවශ්‍ය වන ක්ෂේත්‍ර දත්ත හා අනෙකුත් දත්ත ලබා ගැනීම සහ අන්තර්ජාතික වර්ගීකරණයට අනුකූලව එක් එක් පස් වර්ග වර්ගීකරණය කිරීම. 2) පස නිර්මාණය වීමේ සාධක (දේශගුණය, භූ විෂමතාවය, භූ විද්‍යාත්මක කරුණු යනාදිය) සැලකිල්ලට ගනිමින් ඒ ඒ පාංශු ගණ හෝ ශ්‍රේණිවල පිහිටීම හා පැතිරීම තීරණය කිරීම. 3) අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව පාංශු පැතිකඩයන්හි සවිස්තරාත්මක සටහනක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන පරිද්දෙන් පාංශු නියැදි ලබා ගැනීම, එම පාංශු නියැදි විශ්ලේෂණය සඳහා රසායනාගාරයට භාර දීම, එම විශ්ලේෂණ දත්ත හා ක්ෂේත්‍ර නිරීක්ෂණ දත්ත පදනම් කරගනිමින් අවසාන පාංශු සිතියම්හි නිරවද්‍යතාව තහවුරු කරගැනීම සහ පාංශු යතුර පිළියෙල කර ගැනීම. 4) අදාළ ප්‍රදේශවල ගුවන් ඡායාරූප ත්‍රිමානේක්ෂය උපයෝගී කරගනිමින් ගුවන් ඡායාරූප විශ්ලේෂණය කිරීම. 5) දත්ත අවශ්‍ය වන තීව්‍රතාව අනුව පාංශු සමීක්ෂණ කටයුතු සිදු කර ක්ෂේත්‍ර දත්ත ලබා ගැනීම, පස් පැතිකඩ අනුව පස් වර්ග හඳුනාගැනීම.

අනු. අංකය	*තනතුරු නාමය*	*පැවරෙන කාර්යයන්*
		6) ක්ෂේත්‍රයේදී ලබාගන්නා වූ නිරීක්ෂණ දත්ත මත දළ පාංශු සිතියම (Draft Soil Map) පිළියෙල කිරීම සහ පෙන්ටොග්‍රාෆ් යන්ත්‍රය භාවිත කරමින් අවශ්‍ය පරිමාණයට සකස් කිරීම. 7) ක්ෂේත්‍රයේදී ලබාගන්නා වූ නිරීක්ෂණ දත්ත හා අන්තර්ජාලය උපයෝගී කරගෙන ඉඩම් පරිහරණ සිතියම් පිළියෙල කිරීම. 8) ජී.පී.එස්. (ජී.පී.එස් - Global Position System) උපකරණ මඟින් දත්ත ලබාගැනීම. 9) පසේ ජල සන්නායකතාව පිළිබඳ දත්ත ලබා ගැනීම. 10) ක්ෂේත්‍රයේදී ක්ෂේත්‍ර කම්කරු මුරකරු සහ රියදුරන්ගේ පාලන කටයුතු (අධීක්ෂණ කටයුතු) සිදු කිරීම සහ ඔවුන්ගේ මූල්‍යමය රාජකාරී කටයුතු සෘජුවම සිදු කිරීම
10.	පර්යේෂණ සහකාර (ජල ශක්ති)	ජල ශක්ති අංශයේ ඉංජිනේරුවරුන්ගේ කටයුතුවලට සහාය වීම, ජල ශක්ති අංශයට අදාළ ඉදිකිරීම් වැඩවලට සියලුම ක්ෂේත්‍ර කටයුතු උපකරණ, ද්‍රව්‍ය, කම්කරු පාලනය, ජලශක්ති ආදර්ශන මෙහෙය වීම, ගොඩනැගිලි හා අනෙකුත් යටිතල පහසුකම් නඩත්තුව, ජල ශක්ති අංශයේ ඉදිකිරීම් වැඩවලට අදාළ ඇස්තමේන්තු, සැලසුම්පත් සකස් කිරීම, දෙපාර්තමේන්තුවට අදාළ සියලුම යාන්ත්‍රික හා ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියාවන්ට සම්බන්ධ වීම, එම උපකරණ මිලදී ගැනීමට අදාළ පිරිවිතර සකස් කිරීම සහ ඒවා මිලදී ගැනීමේදී හා තත්ත්ව වාර්තා සකස් කිරීමේදී අදාළ කටයුතුවලට සහාය වීම.
11.	යාන්ත්‍රික මූලික	සුළු සේවකයන් පාලනය කිරීමේදී සහ රථ වාහන, යන්ත්‍ර ආදිය සඳහා ලදුපත් පිළියෙල කිරීමේදී යාන්ත්‍රික ඉංජිනේරුවරයාට සහාය වීම, තාක්ෂණ සහායක (යාන්ත්‍රික) හෝ වැඩ ලිපිකරු සමඟ වැඩ ආරම්භ කිරීම, ගබඩා භාරකරු නොමැති අවස්ථාවලදී අලුත්වැඩියාව සඳහා පැමිණෙන අයිතමයන් තමන් භාරයට ගැනීම, අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් ආයුධ සහ ද්‍රව්‍ය ආදිය ලබා ගැනීම, ගබඩා පොත් නඩත්තු කිරීම, ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී යාන්ත්‍රික ඉංජිනේරුවරයාට සහාය වීම, අලුත්වැඩියා කිරීමෙන් පසු නිසි පරිදි ආපසු භාර දීම සහ අබලි අමතර කොටස් ද්‍රව්‍ය සහ භාණ්ඩ ආපසු ගබඩාවට භාරදීම කරන ලද අලුත්වැඩියාවන් ලොග් පොත්වල ඇතුළත් කිරීම, තාක්ෂණ සහායක (යාන්ත්‍රික) හෝ පිරිවැය ලිපිකරු සමඟ මුළු පිරිවැය (බිල්පත්) පිළියෙල කිරීම, පාවිච්චි කරන ලද අමතර කොටස් ඉන්ධන ලිහිසි තෙල් සහ අනෙකුත් දේ වෙනුවෙන් ද්‍රව්‍ය වාර්තාව ඉදිරිපත් කිරීම. අලුත්වැඩියාවලට යාන්ත්‍රික වැඩපළට රැගෙන එන යන්ත්‍ර හා වාහන, ගබඩා භාරකරුගෙන් යාන්ත්‍රික වැඩපළට භාරගෙන, අලුත්වැඩියාව නිම වීමෙන් පසු නැවත ගබඩා භාරකරු වෙත භාර දීම.

2. බඳවා ගැනීමේ ක්‍රමය :

2.1. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාව හා සහතික පත්‍ර පරීක්ෂා කර බැලීම සඳහා වන අතර, සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

2.3. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාව ලද පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව හෝ මාර්ගගතව හෝ ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ.

3. වැටුප් :

පුහුණු කිරීමේ ශ්‍රේණිය - එක් වසරක පුහුණු කිරීමේ ශ්‍රේණියේදී තමන් කලින් දැරූ වැටුප් පරිමාණයේම තව දුරටත් රැඳී සිටිය යුතු අතර, පුහුණු පාඨමාලාව අවසානයේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගය සමත් වන තුරු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ බඳවා ගැනීමේ ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ. පුහුණුව සතුටුදායක ලෙස සම්පූර්ණ කොට විභාගය සමත් වීමෙන් පසු 2000.03.02 දිනැති අංක 07/2000 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව වැටුප් පරිවර්තනය කරනු ලැබේ.

III වන ශ්‍රේණිය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛණ I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 52250-10X800-11X1190-10X1320-10X1350- 100040/- වේ. (MN3 -2025)

4. සේවා ගණය - අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික

4.1. ශ්‍රේණි- III ශ්‍රේණිය
II ශ්‍රේණිය
I ශ්‍රේණිය

4.2. තනතුරෙහි ස්වභාවය - මෙම පත්වීම ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.

5. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි -

5.1. පුහුණු කාල සීමාව අවසානයේ III ශ්‍රේණියට බඳවා ගැනීම.
පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලබන අයදුම්කරුවන් අදාළ පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

5.2. පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයන් ඔවුන්ගේ පූර්ව තනතුරුවලට මුදා හැරේ.

5.3. III වන ශ්‍රේණියට බඳවා ගන්නා නිලධරයන් වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, වැඩ බැලීමේ කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් නිබේ නම් වැඩ බැලීමේ කාලය අවසානයේදී සේවයේ ස්ථිර කරනු ලැබේ

6. වයස් සීමාව : අදාළ නොවේ.

7. අවශ්‍ය සුදුසුකම් :

7.1. අධ්‍යාපන සුදුසුකම්

7.1.1. භාෂාව හෝ සාහිත්‍ය, විද්‍යාව, ගණිතය යන විෂයයන්වලට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත් වීම.

7.2. වෘත්තීය සුදුසුකම් :

තනතුරට අදාළව පහත සඳහන් වෘත්තීය සුදුසුකමක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්ද.

තනතුරු නාමය	වෘත්තීය සුදුසුකම්
සැලසුම් ශිල්පී පාංශු ප්‍රස්ථාරක	රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.
විදුම් සහකාර ජල විද්‍යා සහකාර ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය) සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක	රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක තුන් අවුරුදු ජාතික තාක්ෂණ සහතික පත්‍ර සිවිල් (NCT – Civil) පාඨමාලාව සම්පූර්ණ කර, අදාළ සහතිකය ලබා තිබීම.
පස් සමීක්ෂක	රජය විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන කෘෂිවිද්‍යාව සම්බන්ධ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා අදාළ සහතිකය ලබා තිබීම. (මෙම පාඨමාලාව අර්ධකාලීන නම් තුන් වසරක් ද, පූර්ණ කාලීන නම් අවම වශයෙන් මාස 09 ක් විය යුතු ය.)
පර්යේෂණ සහකාර (සාමාන්‍ය)	රජය විසින් අනුමත ආයතනයක් මඟින් පිරිනමනු ලබන රසායන විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා අදාළ සහතිකය ලබා තිබීම. (මෙම පාඨමාලාව අර්ධකාලීන නම් තුන් වසරක් ද, පූර්ණකාලීන නම් අවම වශයෙන් මාස 09ක් විය යුතු ය)
පර්යේෂණ සහකාර (ජලශක්ති)	රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක තුන් අවුරුදු ජාතික තාක්ෂණ සහතික පත්‍ර (සිවිල්) (NCT-Civil) පාඨමාලාව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම; *හෝ* රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.
යාන්ත්‍රික මූලික	රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක තුන් අවුරුදු ජාතික තාක්ෂණ සහතික පත්‍ර (යාන්ත්‍රික) පාඨමාලාව (NCT – Mechanical) සම්පූර්ණ කර, අදාළ සහතිකය ලබා තිබීම.

7.3. පළපුරුද්ද :

ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථීර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

7.4. කායික සුදුසුකම්:

සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

7.5. වෙනත් සුදුසුකම් :

I. නියමිත දිනට පූර්වාසන්නව රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසයින් වසර 5ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර, ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.

II. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

8. විභාග පරිපාටිය :

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල සහ දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
1. බුද්ධි පරීක්ෂණය	පැය 01	100	40
2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය	පැය 03	100	40

8.1. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

1. බුද්ධි පරීක්ෂණය (සෑම තනතුරක් සඳහාම පොදු වේ)

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
බුද්ධි පරීක්ෂණය	අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල භාවයත් සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ.

2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය :

- සැලසුම් ශිල්පී තනතුර සඳහා

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය	ඇඳීමේ මූල ධර්ම පාවිච්චි කර දෙන ලද සටහන් අනුව වස්තුවක හෝ කොටසක හරස්කඩක් සහ පෙර හෝ පසු පෙනුමක් ඇඳීම.

- විදුම් සහකාර/පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය) / සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක / පර්යේෂණ සහකාර (ජලශක්ති) තනතුරු සඳහා

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය	මූලික ගණිත හා විද්‍යා දැනුමත් මූලික සිවිල් ඉංජිනේරුමය දැනුමත් පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්ත වේ.

- පස් සමීක්ෂක තනතුර සඳහා

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය	මූලික ගණිත හා විද්‍යා දැනුමත් පාංශු රසායන විද්‍යාව පිළිබඳ දැනුමත් පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්ත වේ.

- ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර /ජල විද්‍යා සහකාර තනතුර සඳහා

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය	මූලික ගණිතය (අ.පො.ස. (සා/පෙළ) මට්ටම) හා විද්‍යා දැනුමත් ජල විද්‍යාත්මක ක්ෂේත්‍රය පිළිබඳ දැනුමත්, මූලික සිවිල් ඉංජිනේරුමය දැනුමත් පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්ත වේ.

- පර්යේෂණ සහකාර (සාමාන්‍ය) තනතුර සඳහා

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය	මූලික ගණිත හා විද්‍යා දැනුමත් විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ දැනුමත් පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්ත වේ.

- පාංශු ප්‍රස්ථාරක තනතුර සඳහා

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය	මූලික ගණිත හා විද්‍යා දැනුමත් සැලසුම් ශිල්පය පිළිබඳ දැනුමත් පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්ත වේ.

- යාන්ත්‍රික මූලික තනතුර සඳහා

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය	වාහන යන්ත්‍රෝපකරණ සහ යාන්ත්‍රික වැඩපළවල නඩත්තු සහ පරිපාලනය පිළිබඳ සාමාන්‍ය දැනුම සහ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්නපත්‍රවලින් යුක්තය.

9. අයදුම් කිරීමේ ක්‍රමය :

9.1 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත් හා වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-Mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.2 අයදුම් කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ඉහත කුමන තනතුරට ද යන්න අදාළ ස්ථානයෙහි (√) සලකුණ මගින් පැහැදිලිව සලකුණු කිරීම අනිවාර්ය වේ. යම් අයදුම්කරුවකු තනතුරු කිහිපයක් සඳහා අයදුම් කරන්නේ

නම් ප්‍රමඛතා අනුපිළිවෙළ සඳහන් මාර්ගගත අයදුම්පත් යොමු කළ යුතුවේ. එක් අයදුම්කරුවකුට අයදුම් කළ හැකි උපරිම තනතුරු සංඛ්‍යාව තුනකි (03).

9.3 අයදුම්කරු විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර, විභාග දිනයේ ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ එසේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයයි. අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර ලබා දෙනු නොලැබේ.

9.4 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.5 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් කිරීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු වේ.

9.6 ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කරගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.7 සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

10. විභාග ගාස්තු :

❖ **විභාග ගාස්තුව රු. 1,200/- කි**. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත සඳහන් ගාස්තු ගෙවීමේ ක්‍රම වේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය.

(i.) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card);
(ii.) අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the facility of internet transactions);
(iii.) ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රම මඟින් (Online Banking Method of Bank Of Ceylon);
(iv.) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank Of Ceylon).

සටහන-

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

11. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :

11.1 විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එසේම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැලඳ ගෙන නොමැති බව සනාථ කරගත හැකි වන පරිදි මුහුණ සහ දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරගනු නොලැබේ. තව ද, විභාග ශාලාවට ඇතුළත් වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

12. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

12.1 අපේක්ෂකයකුට අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

13. පොදු කරුණු:

13.1 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවේ. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණ අවසාන තීරණය වේ.

13.2 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව හා මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

13.3 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

ඉංජි. පී.එම්. ජයදීර,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2026 ඔක්තෝබර් මස 19 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07 .

10 - 743